ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංකː 2477424, 2477423, 2477311
ෆැක්ස්ː 2346257, 2477739
ඊ-මේල්ː dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවියː www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව |
| දිනය | 2014 ජුලි 24 |

## ශ්‍රී ලංකා මහ බැංකුව, ඉන්දියානු සංචිත බැංකුව සමඟ ආයෝජන ගිවිසුමකට එළඹෙයි

ශ්‍රී ලංකා මහ බැංකුව 2014 ජූලි මස 24 වන දින ඉන්දියානු සංචිත බැංකුව සමඟ ද්විපාර්ශ්වික ආයෝජන ගිවිසුමකට එළඹිණි. එමගින් ශ්‍රී ලංකා මහ බැංකුවට සිය සංචිත කළමණාකරන කටයුතු, ඉන්දියානු රුපියල් වලින් ඇති වත්කම් දක්වා තවදුරටත් විවිධාංගීකරණය කිරීමට අවකාශ ලැබේ. මෙම ගිවිසුම හරහා රාජ්‍යයන් දෙකටම ඇමරිකානු ඩොලර් මිලියන 500 ක උපරිමයකට යටත්ව දෙරටෙහි රාජ්‍ය සුරැකුම්පත් වෙළෙඳපොළෙහි ආයෝජනය කිරීමේ අවස්ථාව උදාවේ. එහි ප්‍රතිඵලයක් ලෙස ශ්‍රී ලංකා මහ බැංකුවට සිය ආයෝජිත අරමුදල් සඳහා සැලකිය යුතු ඉහළ ප්‍රතිලාභයක් ලබාගත හැකිවන අතර ලොව වර්ධනය වෙමින් පවත්නා සුරැකුම්පත් වෙළෙඳපොළවලින් එකකට පිවිසීමේ හැකියාවද ලැබේ. එමෙන්ම ඉන්දියානු සංචිත බැංකුව, ශ්‍රී ලංකා රාජ්‍ය සුරැකුම්පත් වෙළෙඳපොළෙහි ආයෝජනය කිරිම තුලින් ශ්‍රී ලංකා රාජ්‍ය බැඳුම්කර වෙළෙඳපොළෙහි ඉහළ ස්ථායීතාවයකටද මඟ පැදෙනු ඇත.

මෙම ද්විපාර්ශවික ගිවිසුම ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති අජිත් නිවාඩ් කබ්රාල් සහ ඉන්දියානු සංචිත බැංකුවේ අධිපති ආචාර්ය රඝුරාම් රාජන් යන මහත්වරුන් විසින් කලාපීය සහයෝගීතාවය සඳහා වූ දකුණු ආසියාතික සංගමයේ (සාර්ක්) රාජ්‍යයන්හි මහ බැංකු අධිපතිවරුන්ගේ හමුවේ දී, හුවමාරු කර ගන්නා ලදී.

මෙම ඓතිහාසික ගිවිසුම, 2014 ජූලි මස 25 වැනි දින කොළඹ දී පැවැත් වූ මහ බැංකු අර්ථශාස්ත්‍රඥයන්ගේ “අන්තර් කලාපීය සංචිත ආයෝජන හරහා අනොන්‍ය ප්‍රතිලාභ ලබාගැනීම” යන තේමාව යටතේ පැවැත් වූ හමුවට ද මනා පදනමක් සලසා දෙන ලදී.

පහත ඡායාරූපයෙන්, ශ්‍රී ලංකා මහ බැංකු අධිපති අජිත් නිවාඩ් කබ්රාල් මහතා සහ ඉන්දියානු සංචිත බැංකුවේ අධිපති ආචාර්ය රඝුරාම් රාජන් මහතා විසින් කොළඹ දී පැවැති සාර්ක් මහ බැංකු අධිපතිවරුන්ගේ සමුළුව සහ සාර්ක් ජ්‍යෙෂ්ඨ මහ බැංකු ආර්ථශාස්ත්‍රඥයන්ගේ හමුව අතරවාරයේ දී අදාල ද්විපාර්ශවික ගිවිසුම හුවමාරු කරගැනීමේ අවස්ථාව දැක්වේ. දෙවන ඡායාරූපයෙන් වමේ සිට දකුණට පිළිවෙළින් ආචාර්ය නන්දලාල් වීරසිංහ මහතා, නියෝජ්‍ය අධිපති, ශ්‍රී ලංකා මහ බැංකුව; එච්. ඒ. කරුණාරත්න මහතා, අධ්‍යක්ෂ, ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව; ආචාර්ය යුබා රාජ් කටිවාඩා මහතා, නේපාල රාස්ට්‍ර බැංකුවේ අධිපති; දීපක් මොහන්ති මහතා, විධායක අධ්‍යක්ෂ, ඉන්දියානු සංචිත බැංකුව සහ විවේක් අග්‍රාවාල් මහතා, සාමාන්‍යාධිකාරී සහ අධිපති විධායක සහායක, ඉන්දියානු සංචිත බැංකුව, දෙරටෙහි මහ බැංකු අධිපතිවරුන් විසින් අදාල ගිවිසුව හුවමාරු කරගැනීමෙන් පසු ඡායාරූපයකට පෙනී සිටි අවස්ථාව දැක්වෙයි.



Yuba Raj Khatiwada
Governor
Nepal Rastra Bank
Dr. Raghuram Rajan
Governor
Reserve Bank of India


